පනාගොඩ, ඒ.එස්.පී.පී
ශාරීරික අධ්‍යාපන උපගුරු, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

*Paper: Equity*

# අභිකුණ්ටිකයෝ

අතීතයේදී ස්ථිර වාසස්ථානයක් නොවූ එහෙත් වර්තමානයේ පාලකයන් විසින් ස්ථිර වාසස්ථාන ඉදිකර දී ජීවන තත්වය නගා සිටුවීමට කටයුතු කර ඇති තවත් එක් ප්‍රාථමික ජන කොටසක් ලෙස අභිකුණ්ටිකයන් හඳුන්වා දිය හැකිය.

ලංකාවේ උතුරුමැද, සබරගමුව, බස්නාහිර හා නැගෙනහිර පළාත්වල මොවුන් වැඩිපුර සැරිසරයි. මොවුන් ඉන්දියාව හා ලංකාව මුහුදින් සම්බන්ධව පැවති අවධියේදී සංක්‍රමණික ජාතියක් ලෙස මෙරටට පැමිණි අය වන අතර මොවුන්ගේ දිවි පෙවෙත ඈත අතීතයට දිවයන බව පන්සිය පනස් ජාතක පොතේ එන ජාතක කතා කීපයකින්ම පිළිබිඹු වෙයි. ලෝකයේ බොහෝ රටවල මේ ප්‍රාථමික ජනයා ජීවත් වන අතර ශ්‍රී ලාංකික අභිකුණ්ටික ජනයා කිසිසේත්ම භාෂාව හා සංස්කෘතිය අතින් සිංහල ජනයාට සමාන නොවේ. මොවුන් තෙළිඟු මිනිසුන්ට සමාන තෙළිඟු බස කථාකරන ජාතියක් වේ. වාග්මාලාව ඉතා සරල කුඩා එකක් වෙයි. මොවුන් වර්තමාන ශ්‍රී ලංකාව තුල ඔවුන්ගේ මූලස්ථාන පිහිටුවාගෙන ඇති අතර ඔවුන්ගේ විවාහ සිරිත්, ණය ගනුදෙනුකරන ආකාරය, ඉදිරි වැඩ පිළිවෙලවල් යොදන ආකාරය, අනාගත මාසවල සංචාරක කටයුතු, ඔවුන්ගේ අධිකරණ කටයුතු, ප්‍රවාහන කටයුතු, බෙහෙත් ද්‍රව්‍ය, වැඩිවියට පැමිණීමේ අවස්ථා, අවමංගල සිරිත් විරිත්, නායකයා පත්කිරීම, බාහිර පුද්ගලයන්ට සැලකීම, ඔවුන්ගේ දිවුරුම් ක්‍රම, උපත් චාරිත්‍ර ආදිය අනෙකුත් ප්‍රාථමික සමාජ වලට වඩා වෙනස් වන අතර සිංහල ජාතියට වඩා බොහෝම වෙනස්ය.

මොවුන් තැන තැන ගොස් තාවකාලික නිවාස තනා සිය පාරම්පරික රැකියාවල් වන නයිනැටවීම හා ශාස්ත්‍රකීම කරනු ලබන අතර වර්තමානයේ නම් සමාජගත වීමත් සමග දෙවන තුන්වන පරම්පරාවේ පිරිස් විවිධ රැකියාවන්හි නිරත වනු දක්නට ලැබේ. ශ්‍රී ලංකීය සමාජය තුළ පැවතුම් වෙනස්කිරීම් තුළින් මෙන්ම විදේශ ගතවීම හා විධිමත් අධ්‍යාපනයට යොමුවීම තුළින් මහා සමාජයේ සම්මත සමාජ ක්‍රමයන්ට හුරුවීමේ ප්‍රවණතාවක් පවතින නමුත් එහිදී මොවුනට ගැටලු රාශියකට මුහුණදීමට සිදුව ඇති බව පෙනේ. මේ තත්වය මත මොවුන් යෙදෙන රැකීරක්ෂා පිළිබඳවත් ඒ පිළිබඳව සමාජ පිළිගැනීම කෙබඳු ආකාරයට සිදුවේද, මොවුන්ට තනා දුන් නිවාස හා ලබා දී ඇති ගොඩමඩ ඉඩම් නිසා මොවුන් තුල සිදුවූ විපර්යාසයන් කෙබඳුද යන්නත් නිවාසයන්හි පදිංචිය ආගමික කටයුතු වලදී ඔවුන්ට පිටුවහලක් වූයේද, ඔවුන්ගේ ආගමික කටයුතු පිළිගැනීමේ තත්වය මත වෙනස් මුහුණුවරක් ගන්නේද යන්නත් පෙර රැකියා අතහැරීමට ඇති අකමැත්ත පිළිබඳවත් ඔවුන්ගේ අනාගත යහපත ඇතිකරලීමට කුමක් කළයුතුද, යන්නත් මෙමගින් සාකච්ඡා කෙරේ.